# බළන්ගොඩ නගර සභාව
# ටෙන්ඩර් දැන්වීම

**2025 වර්ෂය සඳහා බළන්ගොඩ නගර සභාවට අයත් පොදු වෙළඳසැල අංක 15,16,17 දරන මස් කඩ බදු දීම, පොදු වෙළඳසැල අංක 09,10,11,12,14,18 දරන මාළු කඩ බදු දීම, බළන්ගොඩ නගරයේ පෞද්ගලික බස් ගාල් ගාස්තු අය කිරිම, බළන්ගොඩ නගරයට රථ වාහන ඇතුළු කිරීමේ හා නැවතුම් ගාස්තු අය කිරීම සහ ඉරිදා සතිපොළෙහි පොළ ගාස්තු අය කිරීමේ අයිතිය බදුදීම සඳහා සුදුසු බදු කරුවන් තෝරා පත් කර ගැනීමට ටෙන්ඩර් පත් කැඳවීම.**

2025 ජනවාරි මස 01 වන දින සිට 2025 දෙසැම්බර් මස 31 වන දින දක්වා වු වර්ෂයක කාලයක් සඳහා පහත උප ලේඛනයේ විස්තර කරනු ලබන දේපළ බදු දීම වෙනුවෙන් මුද්‍රා තබන ලද ටෙන්ඩර් අයදුම්පත් බළන්ගොඩ නගර සභාවේ ලේකම් සමරවීර හෙන්ඩ්‍රිලාගේ අමිතා කරුණාරත්න වන මා විසින් 2024 දෙසැම්බර් මස 12 වන දින පෙ.ව.10.00 දක්වා භාරගනු ලැබේ. වැඩි විස්තර සතියේ වැඩ කරන දිනයන්හි වැඩ කරන වේලාව තුල දි කාර්යාලීය දුරකථන අංක 045-4930830 ඇමතීමෙන් හෝ info@balangoda.uc.gov.lk වෙතින් ලබාගත හැකි ය.

**ටෙන්ඩර් පත් නිකුත් කිරිම:**

2024 දෙසැම්බර් මස 11 වන දින ප.ව. 3.00 දක්වා ටෙන්ඩර් පත් බළන්ගොඩ නගර සභා කාර්යාලයේ දී නිකුත් කරනු ලැබේ.

**ටෙන්ඩර් පත් භාරගැනීම:**

2024 දෙසැම්බර් මස 12 වන දින පෙ.ව.10.00 දක්වා ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ. ටෙන්ඩර් අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කර මුද්‍රා තබන ලද ටෙන්ඩර් අයදුම්පත් කාර්යාලයේ තැන්පත්කර ඇති ටෙන්ඩර් පෙට්ටියට අතින් ගෙනවිත් බහාලීම හෝ ලේකම්, බළන්ගොඩ නගර සභාව යන ලිපිනයට 2024 දෙසැම්බර් මස 12 වන දින පෙ.ව.10.00 ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් හෝ යොමු කළ හැකි ය. නියමිත වේලාවට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ටෙන්ඩර් පත් විවෘත කිරිම:**

2024 දෙසැම්බර් මස 12 වන දින පෙ.ව. 10.30 ට ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. මෙම අවස්ථාවට ටෙන්ඩර් අයදුම්කරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගි විය හැකිය.

**උප ලේඛනය (1)**

| අනු අංකය | ටෙන්ඩර් පත් කැඳවනු ලබන වෙළෙඳාමේ ස්වභාවය | ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් ඇප තැන්පත් මුදල | අයදුම්පත් ගාස්තුව | අවම මාසික ටෙන්ඩර් මුදල |
|---|---|---|---|---|
| 01. | පොදු වෙළඳසැල අංක 09 දරන මාළු කඩ කාමරය | රු.5,000.00 | රු.1000.00 | රු.12,375.00 |
| 02. | පොදු වෙළඳසැල අංක 10 දරන මාළු කඩ කාමරය | රු.5,000.00 | රු.1000.00 | රු.12,375.00 |
| 03. | පොදු වෙළඳසැල අංක 11 දරන මාළු කඩ කාමරය | රු.5,000.00 | රු.1,000.00 | රු.12,375.00 |
| 04. | පොදු වෙළඳසැල අංක 12 දරන මාළු කඩ කාමරය | රු.5,000.00 | රු.1,000.00 | රු.12,375.00 |
| 05. | පොදු වෙළඳසැල අංක 14 දරන මාළු කඩ කාමරය | රු.5,000.00 | රු.1,000.00 | රු.12,375.00 |
| 06. | පොදු වෙළඳසැල අංක 18 දරන මාළු කඩ කාමරය | රු.5,000.00 | රු.1,000.00 | රු.26,250.00 |
| 07. | පොදු වෙළඳසැල අංක 15 දරන එළු මස් කඩ කාමරය | රු.10,000.00 | රු.1,000.00 | රු.12,375.00 |
| 08. | පොදු වෙළඳසැල අංක 16 දරන එළ හරක් මස් කඩ කාමරය | රු.100,000.00 | රු.1,000.00 | රු.450,000.00 |
| 09. | පොදු වෙළඳසැල අංක 17 දරන කුකුළු මස් කඩ කාමරය | රු.10000.00 | රු.1000.00 | රු.22,600.00 |

| | | | | |
|---|---|---|---|---|
| 10. | බළන්ගොඩ නගරයේ පෞද්ගලික බස් ගාල් ගාස්තු අය කිරීම | රු.20,000.00 | රු.1,000.00 | රු.142,575.00 |
| 11. | බළන්ගොඩ නගරයට රථවාහන ඇතුළුකිරීම හා නැවතුම් ගාස්තු අය කිරීම | රු.20,000.00 | රු.1,000.00 | රු.120,180.00 |

**උප ලේඛනය (11)**

| අනු අංකය | ටෙන්ඩර් පත් කැඳවනු ලබන වෙළෙඳාමේ ස්වභාවය | ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් ඇප තැන්පත් මුදල | අයදුම්පත් ගාස්තුව | අවම සතියක ටෙන්ඩර් මුදල |
|---|---|---|---|---|
| 01 | ඉරිදා සතිපොළෙහි පොළ ගාස්තු අය කිරීම | රු. 25,000.00 | රු. 2,000.00 | රු. 75,000.00 |

**විශේෂ කොන්දේසි:**

- ✓ ටෙන්ඩර් අයදුම්පත්‍ර ලබාගැනීම සඳහා තම අනන්‍යතාවය තහවුරු කිරීමට ජාතික හැඳුනුම්පත හෝ වලංගු රියදුරු බලපත්‍රය හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ ඉදිරිපත් කළ යුතුය.

- ✓ එක් එක් ටෙන්ඩරය සඳහා වෙන වෙනම ටෙන්ඩර් පත් ඉදිරිපත් කල යුතු අතර, ලියුම් කවරයේ වම්පස ඉහල කෙළවරේ තමා ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩරයේ නම සඳහන් කළ යුතුය.

- ✓ ඉදිරිපත් කරන ටෙන්ඩරයේ මුදලට හා ඉහත උප ලේඛනයේ සඳහන් ගාස්තු සඳහා රජය විසින් පනවනු ලබන බදු මුදල්ද ගෙවිය යුතුය.

- ✓ අයදුම්පත් ලබා ගැනීමට දිවයිනේ ඕනෑම ප්‍රදේශයක පදිංචිකරුවෙකුට අවස්ථාව පවතින අතර, **එළ හරක් මස්** සපයා ගැනීම බළන්ගොඩ නගර සභා සීමාව තුළ පිහිටි රජයේ අනුමත ගෝ ඝාතකාගාරයකින් විය යුතුය.

- ✓ තෝරා ගන්නා ලද බදු කරුවන් ගිවිසුම් ඇප තැන්පත් මුදල් වශයෙන් මාස තුනක කුලී මුදලට සමාන මුදලක් සභාවට ගෙවිය යුතු අතර, එය වාරික දෙකක් වශයෙන් බළන්ගොඩ නගර සභාවට ගෙවිය හැකිය. එම මුදලින් තුනෙන් එකක් නොහොත් මසක කුලිය බදුකරු තෝරා ගැනීමෙන් පසු පළමු පැය තුළ ගෙවිය යුතු ය. එසේ නොගෙවන බදුකරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉතිරි කොටස් දෙක නොහොත් මාස දෙකක කුලිය එකවර ගෙවා 2024.12.31 දින වන විට ගිවිසුම් අත්සන් කළ යුතුය.

- ✓ ඉරිදා සතිපොළ සඳහා තෝරා ගන්නා ලද බදු කරුවන් ගිවිසුම් ඇප තැන්පත් මුදල් වශයෙන් මාසයක (සති 04ක)කුලී මුදලට සමාන මුදලක් සභාවට ගෙවිය යුතු අතර, එය වාරික දෙකක් වශයෙන් බළන්ගොඩ නගර සභාවට ගෙවිය හැකිය. එම මුදලින් හතරෙන් එකක් නොහොත් සතියක කුලිය බදුකරු තෝරා ගැනීමෙන් පසු පළමු පැය තුළ ගෙවිය යුතු ය. එසේ නොගෙවන බදුකරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉතිරි කොටස් තුන නොහොත් සති තුනක කුලිය එකවර ගෙවා 2024.12.31 දින වන විට ගිවිසුම් අත්සන් කළ යුතුය.

- ✓ සියළුම හෝ ඕනෑම ටෙන්ඩරයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය බලංගොඩ නගර සභාවේ ටෙන්ඩර් මණ්ඩලය සතුවේ.

- ✓ ටෙන්ඩර් කොන්දේසි සහ විස්තර ටෙන්ඩර් අයදුම් පත්‍රය සමඟ ලබාදෙනු ලැබේ.

2024 නොවැම්බර් මස 21 වන දින,
බළන්ගොඩ නගර සභාවේදීය.

එස්.එච්.ඒ. කරුණාරත්න,
ලේකම් හා බලතල, කාර්ය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
බළන්ගොඩ නගර සභාව.